**ගොවීන්ගේ භාරකාර අරමුදල - 2013**

**-------------------------------------------**

ගොවීන්ගේ භාරකාර අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත මූල්‍ය ප්‍රකාශන 1994 මාර්තු 09 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අරමුදලේ භාරකරුවන් අතර එළඹි භාරකාර ඔප්පුවේ 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් භාරකරුවන්ගේ වගකීම**

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**--------------------**

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

1.4 **මතය ව්‍යාචනය සඳහා පදනම**

---------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ හා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ ඒකාබද්ධ අරමුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගතවූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේ දැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1 මතය ව්‍යාචනය**

**----------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

### 2.2.1 ගොවීන්ගේ භාරකාර අරමුදල නිත්‍යානුකූලව සම්මත කර නොමැති බව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් භාණ්ඩාගාරයේ ලේකම් සහ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් විසින් 1994 මාර්තු 09 දින අත්සන් කර ඇති භාරකාර ගිවිසුම ප්‍රකාර ගොවිසෙත ලොතරැයි ආදායමින් ලබාගන්නා යම් ප්‍රතිශතයක් හා එම මුදල් ආයෝජනය කිරීමෙන් ලබා ගන්නා පොළී ආදායම් කෘෂිකර්ම සංවර්ධනය හා ගොවීන්ගේ සුභසාධනය ඇතුළු අරමුණු 06 ක් ඉටු කර ගැනීමට යොදා ගැනීම සඳහා පරිපාලන කටයුතු වෙනුවෙන් අරමුදල පිහිටුවා ගෙන තිබුණි. 2006 දෙසැම්බර් 22 දිනැති අංක පී එෆ් / 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.3 (ආ) ඡේදය ප්‍රකාර අරමුදලක් පවත්වා ගෙන යාමට සාධාරණ හේතු ඇතිනම් එවැනි අරමුදල් පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කිරීමට හැකිවන පරිදි රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතු බව දක්වා තිබුණි. එසේ වුවද ගොවීන්ගේ භාරකාර අරමුදල පාර්ලිමේන්තු පනතක් මගින් සංස්ථාපනය කිරීමට 2013 දෙසැම්බර් 31 දින වන විටද අපොහොසත් වී තිබුණි.

### 2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ලැබිය යුතු ගිණුම්**

(i) මූල්‍ය ප්‍රකාශනවල භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ගොවිසෙත ලොතරැයි ආදයම් ලෙස දක්වා ඇති මුදල රු.1,291,557,399 ක් වූ අතර ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.

| කාලය | ලැබිය යුතු ආදායම |
|---|---|
| | රු. |
| වර්ෂය 1 ට අඩු | 196,220,108 |
| වර්ෂ 1 – 3 අතර | 405,657,200 |
| වර්ෂ 3 – 5 අතර | 101,705,057 |
| වර්ෂ 5 ට වැඩි | 587,975,034 |
| එකතුව | 1,291,557,399 |

ඉහත සඳහන් මුදල භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ලෙස දක්වා ඇතත්, ඒ සඳහා ශේෂ සනාථ කිරීම් ලබාගෙන නොතිබුණු අතර ශ්‍රී ලංකා ජනරජ ගිණුමේ එම මුදල බැරකමක් වශයෙන් දක්වා නොතිබීම හේතුවෙන් මෙම වටිනාකම හා පැවත්ම සම්බන්ධයෙන් විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

(ii) කෙටි කාලීන ණය යටතේ දක්වා තිබූ වසර 08 ක් ඉක්මවූ කල්පසුවූ ණය ශේෂ 08 ක එකතුව රු:113,110,371 ක් විය.

(iii) අත්තිකාරම් යටතේ දැක්වෙන රු: 6,428,742 ක් වූ ශේෂ 03 ක් වර්ෂ 06 කට වැඩි කාලයක සිට නිරවුල් කර නොතිබුණි.

(ආ) **ගෙවිය යුතු ගිණුම්**

වර්ෂ 04 කට වැඩි කාලයක සිට මුල්‍ය ප්‍රකාශනවල නිරවුල් නොකර ඉදිරියට එන රු.537,984 ක් වූ බැරකම් ශේෂ 02 ක් සමාලෝචිත වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

ගොවීන්ගේ භාරකාර අරමුදලේ ශේෂ පත්‍රයේ දක්වා ඇති පහත සඳහන් වත්කම් හා වගකීම් ශේෂ ඒ ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැතිවීම හේතුවෙන් සත්‍ය වශයෙන්ම පවතින බව හා එහි වටිනාකම නිවැරදි බවට විගණනයේදී සෑහීමකට පත්වීමට නොහැකි විය.

| **විස්තරය** | **ශේෂය** | **ඉදිරිපත් නොවූ සාක්ෂි** |
|---|---|---|
| | රු. | |
| (අ) ලැබිය යුතු කෙටිකාලීන ණය | | |
| (i) ණයගැති පාලන ගිණුම (කෘෂිකාර්මික භාරකාර අරමුදල) | 7,923,175 | උපලේඛන |
| (ii) ණයගැති පාලන ගිණුම - චක්‍රීය අරමුදල | 44,255,850 | උපලේඛන |
| (ආ) ලැබිය යුතු දිගුකාලීන ණය ගොවි බැංකු ණය | 9,112,579 | උපලේඛන |
| (ඇ) ජංගම නොවන වගකීම් ගොවීන්ගේ තැන්පතු | 697,644 | උපලේඛන |

**2.2.4. හඳුනානොගත් වත්කම්**

ජංගම වත්කම් යටතේ ඉතිරි කිරීමේ බැංකු ගිණුම් ශේෂය රු.7,241,655 ක් ලෙස දක්වා තිබූ නමුත්, එම ශේෂය හඳුනා ගැනීම සඳහා බැංකු ගිණුම් අංක, බැංකු පාස්පොත්, ශේෂ සනාථ සහතික ආදී කිසිදු ලියවිල්ලක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ වැඩකටයුතු වලින් රු.228,098,352 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.151,447,614 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.76,650,738 ක ශුද්ධ වර්ධනයක් නිරීක්ෂණය විය. ආදායම් රු.45,840,229 කින් වැඩිවීම සහ වියදම් රු.30,810,509 කින් අඩුවීම මෙම වර්ධනයට හේතුවී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ පැවති තත්ත්වය හා සසඳා පහත දැක්වේ.

| | 2013 | 2012 | වෙනස ප්‍රතිශතයක් ලෙස වැඩිවීම / (අඩුවීම) |
|---|---|---|---|
| | රු. | රු. | |
| **අයභාර** | | | |
| ගොවිසෙත ලොතරැයි ආදායම | 196,220,108 | 162,211,860 | 21 |
| පොළී ආදායම | 116,914,876 | 104,748,395 | 12 |
| විවිධ ආදායම් | 375,500 | 710,000 | (47) |
| **මුළු අයභාරය** | **313,510,484** | **267,670,255** | **17** |
| **වියදම්** | | | |
| සංවර්ධන වියදම | 83,665,076 | 114,379,705 | (26) |
| අනෙකුත් වියදම් | 1,747,056 | 1,842,936 | (5) |
| **මුළු වියදම** | **85,412132** | **116,222,641** | **(26)** |
| මුළු අතිරික්තය | 228,098,352 | 151,447,614 | 50 |
| ආදායම් බදු වෙන්කිරීම | (2,280,984) | (1,514,476) | |
| **අතිරික්තය** | **225,817,368** | **149,933,138** | **51** |

(ආ) 2012 වර්ෂයේදි හා 2013 වර්ෂයේදි මුළු ආදායමෙන් සංවර්ධන වියදම් පිළිවලින් සියයට 18 ක් හා සියයට 27 ක් වූ අතර එය ගොවිසෙත ලොතැරැයි ආදායම හැර අනෙකුත් ආදායමින් පිළිවෙලින් සියයට 46 ක් සහ සියයට 71 ක් පමණ විය. අයවැය ලේඛන සකස් කිරීමේදි වර්ෂයේ ගොවිසෙත ලොතරැයි ආදායමෙන් සංවර්ධන වියදම් සහ ආයෝජන සඳහා මුදල් යෙදවීමට ඇස්තමේන්තු කර

තිබුණත් 2009 වර්ෂයේ සිට ගොවිසෙත ආදායමින් මුදල් ලැබී නොතිබුණු බැවින් ඇස්තමේන්තු කරන ලද මුළු සංවර්ධන වියදම සහ ආයෝජන කටයුතු සිදු කර නොතිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**අත්තිකාරම් පියවීමේ ප්‍රමාදයන්**

(අ) සංවර්ධන ව්‍යාපෘති 04 ක් සඳහා ලබාදුන් අත්තිකාරම් මුදල් රු.10,151,772 ක් එම කාර්යයන් සඳහා යොදා ගැනීමට කටයුතු නොකර දිගු කාලපමාවකින් පසු ආපසු පියවා තිබුණි.

(ආ) සංවර්ධන කාර්යයන් 05 ක් සඳහා රු.75,663,882 ක අත්තිකාරම් ලබාදී වසරකට වැඩි කාලයක් ඉක්මවා ඇතත් තවදුරටත් රු.4,470,488 ක් නිරවුල් කර නොතිබුණි.

**4.2. නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

සමාලෝචිත වර්ෂයේ මාස 10 කම අරමුදලේ බැංකු ජංගම ගිණුමේ ශේෂය රු. මිලියන 3 ක් ඉක්මවා පැවති අතර, ඉන් අවස්ථා 5 ක දී ශේෂය රු. මිලියන 10 ඉක්මවා තිබූ බැවින් අරමුදලේ මුදල් ප්‍රයෝජනවත් පරිදි යෙදවීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1** සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන 2014 පෙබරවාරි 28 දින ඉදිරිපත් කරනු ලැබුවද එහි වූ ප්‍රමාණාත්මක ගිණුම්කරන දෝෂ හේතුවෙන් 2014 මාර්තු 13 හා 2014 මැයි 23 යන අවස්ථා දෙකකදී එම මූල්‍ය ප්‍රකාශන ආපසු ලබාගෙන සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2014 ජූනි 09 දින ඉදිරිපත් කර තිබුණි.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

(අ) අරමුදලේ අයවැය ලේඛනය අනුව විෂයන් 09 ක ඇස්තමේන්තුගත පිරිවැය රු.69,735,000 වූ අතර සත්‍ය වියදම රු.20,752,047 වුයෙන් අයවැය ලේඛනය සාර්ථක කළමනාකරණ පාලන උපකරණයක් ලෙස යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) අරමුදලේ අයවැය ලේඛනය අනුව රු: 13,253,540 ක ප්‍රතිපාදන වෙන්කළ ව්‍යාපෘති 06 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) අයවැය ලේඛනයෙන් සමාලෝචිත වර්ෂයේ අවිනිශ්චිත වියදම් සඳහා ප්‍රතිපාදන ලෙස රු. මිලියන 20 ක් වෙන් කරගෙන තිබූ අතර ඊට සාපේක්ෂව ඉකුත් වර්ෂයේ අවිනිශ්චිත වියදම් සඳහා ප්‍රතිපාදන රු. මිලියන 4 ක් විය. සමාලෝචිත වර්ෂයේ මෙම අවිනිශ්චිත වියදම් සඳහා ප්‍රතිපාදන වලින් රු. මිලියන 10.25 ක් අයවැය ලේඛනයට ඇතුළත් නොවූ සංවර්ධන වැඩසටහන් 08 ක් සඳහා වැයකර තිබුණි.

## 5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

-------------------------------

භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ 2006 දෙසැම්බර් 22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක පීඑෆ්/423 ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ලේකම්වරයාගේ අවධානය සඳහා යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) අයවැය පාලනය
(ආ) ණයදීම් හා ණය අයකර ගැනීම්
(ඇ) සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම
(ඈ) අරමුදල් උපයෝජනය